<u>කලවාන ප්‍රාදේශීය සභාව</u>

<u>රත්නපුර දිස්ත්‍රික්කය</u>

01. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 02 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 08 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූනි 02 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය.
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට කලවාන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු හා අක්කර බදු ආදායම පිළිවෙලින් රු. 1,535,776 ක් හා රු. 73,663 ක් වුවත්, එකී ආදායම පිළිවෙලින් රු. 1,629,261 ක් හා රු. 80,316 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් වර්ෂයේ ආදායම රු. 100,138 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී වරිපනම් බදු සඳහා ලබාදුන් රු. 27,653 ක්වූ දුන් වට්ටම් වර්ෂයේ වියදමට හර කිරීම වෙනුවට සමුච්චිත අරමුදලට හර කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාලව බදු දී තිබූ අංක 02 මාළු ලැල්ලේ බදුකරු මුදලින් ගෙවා තිබූ රු. 144,583 ක් පමණක් අය විෂයය අංක 5.23 පොදු වෙළඳපල කුලී අය විෂයය යටතේ බිල්කර තිබූ නමුත්, සමාලෝචිත වර්ෂයට අදාල බිල් කල යුතු වටිනාකම රු. 867,500 ක් විය. ඒ අනුව එකී අය විෂයය යටතේ රු. 722,917 ක ආදායම අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණය රු. 19,294,393 ක් වුවත්, රු. 19,231,103 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණය රු. 63,290 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම හඳුනාගැනීමකින් තොරව බිල්කිරීම් ලෙස රු. 10,000 ක් පමණක් ගිණුම්ගත කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු. 17,151,732 ක් වටිනාකමැති වත්කම් පරිත්‍යාග වලින් දායක වීමේ ගිණුම යටතේ ගිණුම්ගත කිරීමෙන් තොරව ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක වීමේ ගිණුම යටතේ ගිණුම්ගත කර තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයෙන් වෙන්දේසි කිරීමට හෝ විනාශ කිරීමට නිර්දේශිත පිරිවැය රු. 55,465 ක් වටිනාකමැති වත්කම් එකී නිර්දේශි ක්‍රියාත්මක කිරීමට පෙර ගිණුම් වලින් ඉවත් කර තිබුණි.

(ඌ) 2011 හා 2014 වර්ෂ වලට අදාලව ණයහිමියන් ලෙස වෙන් කර තිබූ රු. 716,856 ක්වූ ණයහිමි ශේෂ හිමිකම් නොපෑම් හේතුවෙන් කපා හැරීමට තීරණය කර සමුච්චිත අරමුදල් ගිණුම බැර කර ණයහිමි ගිණුම හර කර තිබුණි. නමුත් ජ'නල් සටහනක් මඟින් අදාල ගැලපීම සිදු කර නොතිබුණි.

(එ) වර්ෂ 02 ක් ඉකුත් වූ තැන්පත් ආදායමට ගැනීමට තීරණය කර රු. 728,603 ක්වූ කොන්ත්‍රාත් ඇප හා රු. 97,300 ක්වූ ශිෂ්‍යත්ව ඇප සමුච්චිත අරමුදල හරහා ආදායමට ගැනීමට කටයුතු කිරීමෙන් තොරව එම තැන්පත් ගිණුම යටතේම හර හා බැර වශයෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඒ)(I) සමාලෝචිත වර්ෂයේදී බැංකු ගිණුම් 03 ක් හරහා සිදු කරන ලද අභ්‍යන්තර මුදල් මාරු කිරීම් වූ රු. 870,000 ක් අභ්‍යන්තර මුදල් මාරු ගිණුමක් හරහා ගිණුම්ගත නොකර අත්තිකාරම් ගිණුම යටතේ ගිණුම්ගත කර තිබුණි.

(II) තවද, 2014 වර්ෂයේදී සංවර්ධන ගිණුමෙන් පොදු ගිණුමට අත්තිකාරම් ලෙස ලබාගෙන තිබූ රු. 300,000 ක් 2015 දී නැවත සංවර්ධන ගිණුමට මාරු කිරීමේදී අභ්‍යන්තර මුදල් මාරු ගිණුමක් යටතේ ගිණුම්ගත නොකර පසුගිය වසරේ අත්තිකාරම් පියවීමක් ලෙස වියදමට හර කල යුතුසේ සලකා සමුච්චිත අරමුදලට හර කර තිබුණි.

(ඔ) ඉකුත් වසරට අදාලව ගෙවීමට නොහැකි වී තිබූ එකතුව රු. 917,622 ක්වූ වියදම් වර්ෂය තුලදී ණයහිමියන්ට වෙන් කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී සමුච්චිත අරමුදලට හර කර තිබුණි. ඒ අනුව එකී වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල පිළිබඳව විශ්වාසය තැබිය නොහැකි තත්ත්වයක් ඇති වී තිබුණි.

1.3.2 නොසැසඳු පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 09 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛණ අනුව ශේෂයන් අතර රු. 15,303,666 ක වෙනසක් දක්නට ලැබුණි.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

දේශීය ණය හා සංවර්ධන අරමුදලට තවදුරටත් ගෙවිය යුතු ලෙස දක්වා ඇති රු. 8,148,761 ක්වූ ණය ශේෂය සම්බන්ධයෙන් ශේෂ සනාථන හෝ තහවුරු ලේඛණ කිසිවක් විගණනය වෙත ඉදිරිපත් නොවුණි.

1.3.4 නීති රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති රීති, රෙගුලාසි වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව. | අනුකූල නොවීම්. |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (I) | මුදල් රෙගුලාසි 342 | සභාව සතු උප පත්‍රිකා සභාවේ ස්ථිර මුරකරු භාරයේ ගබඩා ද්‍රව්‍ය තබා ඇති ස්ථානයේ තැන්පත් කර තිබුණි. |
| (II) | මුදල් රෙගුලාසි 371(2)ඇ | දෙන ලද කාර්යය නිම කල විගසම අත්තිකාරම් පියවිය යුතු වුවත්, පසුගිය වර්ෂයන්ට අදාලව රු. 327,189 ක අත්තිකාරම් පියවා නොතිබුණි. |
| (III) | මුදල් රෙගුලාසි 570/571 | රු.6,593,309 ක් වටිනාකමැති ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි. |
| (ආ) | පළාත්පාලනකොමසාරිස්ගේ2009 මාර්තු 09 දිනැති අංක 2009/01 දරන චක්‍රලේඛය | වර්ෂ 05 කට වරක්වත් තක්සේරුගත බදුකුලිය සංශෝධනය කල යුතු අතර, නව වෙළඳ සංකීර්ණයට අයත් කඩකාමර 10 ක ගාස්තු 2006 වර්ෂයෙන් පසුව විගණිත දිනය වූ 2016 පෙබරවාරි 18 දින දක්වා තක්සේරු කර සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | පළාත් පාලන කොමසාරිස්ගේ 2012 මැයි 29 දිනැති අංක 03/2012 දරන චක්‍රලේඛය | නිශ්චිත රාජකාරී කටයුත්ත සඳහන් නොකර ඉදිරිපත් කරනු ලබන බිල්පත් වලට වාහන අංකද රහිතව මුදල් ලබා දීමේ ක්‍රමයකට අනුව 2015 වර්ෂයේදී මන්ත්‍රීවරුන් 07 ක් සඳහා රු. 157,500 ක් ගෙවා තිබුණි. තවද උප සභාපතිවරයාගේ 2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ඉන්ධන දීමනාව වූ රු. 60,000 ක් එකවර ගෙවීම් කර තිබුණි. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 3,331,362 ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 6,239,691 ක් විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය මෙහෙයුම් අතිරික්තය රු. 2,908,329 කින් අඩුවී තිබූ අතර, එය පසුගිය වර්ෂයට වඩා සියයට 47 ක අඩුවීමක් බව නිරීක්ෂණය විය. මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ආදායම අඩුවීම හා පුනරාවර්තන වියදම් වැඩිවීමයි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 2,428 | 2,435 | 3,346 |
| බදු කුලී | 6,615 | 3,900 | 3,977 |
| බලපත්‍ර ගාස්තු | 1,165 | 187 | - |
| වෙනත් ආදායම් | 21,710 | 27,802 | 11,854 |

2.3.2. ආදායම් රැස්කිරීමේ කාර්යයසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් බදු, බදු කුලී ආදායම සහ බලපත්‍ර ගාස්තු යන ආදායම් විෂයයන් රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 07, සියයට 39 හා සියයට 84 ක අඩුවීමක් පෙන්නුම් කෙරිණි.

2.3.3 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.2,520,166 ක්වූ අතර, එයින් රු. 5,000 ට වඩා වැඩි හිඟයක් පවතින වරිපනම් බදුකරුවන් 166 දෙනෙකුගෙන් රු. 1,910,082 ක් අය විය යුතුව තිබුණි. එය මුළු හිඟ වටිනාකමින් 76% ක් පමණ විය.

2.3.4 වෙනත් ආදායම්

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපාර බදු ලබාගත යුතු ආයතන 165 කින්ද, වෙළඳ බලපත්‍ර ලබාගත යුතු ආයතන 36 කින්ද, බලපත්‍ර ලබා නොගැනීම හේතුවෙන් සභා අරමුදලට රු. 229,960 ක් අහිමි වී තිබුණි.

(ආ) සභාව විසින් දැන්වීම් පුවරු හා විදුලි සංදේශ කුළුණු ගාස්තු සඳහා ස්ථිර ලේඛණයක් පවත්වා නොතිබුණි. දැන්වීම් පුවරු ගාස්තු ලෙස 2015 වර්ෂයේදී එක් ආයතනයකින් පමණක් රු. 1,575 ක් ලබාගෙන තිබූ අතර, විදුලි සංදේශ කුළුණු ගාස්තු සම්බන්ධව කිසිඳු ගාස්තුවක් 2015 වර්ෂය තුලදී ලබාගෙන නොතිබුණි.

(ඇ) පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුලදී සභාව සතු ත්‍රීරෝද රථ ගාල් 04 ක ලියාපදිංචි වූ ත්‍රීරෝද රථ හිමියන් 49 කගෙන් ලැබිය යුතු රු. 52,600 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 සැප්තැම්බර් මස සිට 2015 දෙසැම්බර් මස දක්වා මුද්දර ගාස්තු උපලේඛණ ගෙන්වා ගෙන නොතිබූ අතර, එම ආදායම් අයකර ගැනීමේ දීර්ඝ ප්‍රමාදයක් දක්නට තිබුණි.

(ආ) 2014 ඔක්තෝබර් මස සිට 2015 දෙසැම්බර් මස දක්වා උසාවි දඩ උපලේඛණ ගෙන්වා ගෙන නොතිබූ අතර, එම ආදායම් අයකර ගැනීමේ දීර්ඝ ප්‍රමාදයක් දක්නට තිබුණි.

2.3.6 කඩ බදු

------------

(අ) සභාව සතු වත්කම් විෂයන් 16 ක් 2015 වසර සඳහා බදුදීම වෙනුවෙන් ටෙන්ඩර් දැන්වීම් පල කර තිබුණි. මෙකී දැන්වීමේ පල කල දේපල 11 ක් සඳහා ස්ථිර ස්ථානයක් සභාව විසින් ඉදිකර දී නොතිබූ බව ද මේ අනුව එකී දේපල වලින් වාර්ෂිකව කුලී ආදායම් ලබා ගැනීමට තිබූ හැකියාව සභාව විසින් මගහැර තිබූ බැවින් සමස්ථයක් ලෙස එකී වත්කම් වල අවම ලංසු මුදලේ එකතුව වූ රු. 4,870,085 කින් සභාවට අලාභයක් සිදුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය සඳහා බදු දී තිබූ පොල භූමිය මාළු ලැලි අංක 02 හි බදුකරුද යථෝක්ත පරිදි සුදුසු ස්ථානයක් නොමැති බව සඳහන් කරමින් 2015 මාර්තු මස සිට ගිවිසුමෙන් ඉවත් වීම මත 2015 වර්ෂයේදී රු. 722,917 ක අලාභයක් සිදුවී තිබුණි.

(ආ) පොදු වෙළඳසැල එළ හරක් මස් වෙළඳසැල 2014 වර්ෂය සඳහා ගිවිසුම්ගතව බදුදී තිබූ බදුකරුගෙන් 2014 මාර්තු මස සිට නොවැම්බර් මස වනතෙක් අයවිය යුතු මාසික කුලී මුදල් ගෙවීම පැහැරහැර තිබූ බැවින් එකී කුලී මුදල් සමඟ එකතු වූ දඩ මුදල්ද ලෙස එකතුව රු. 538,424 ක්වූ මුදල් සභාවට අයකර ගැනීම සඳහා කිසිඳු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට හෝ ඒ සම්බන්ධව නීත්‍යානුකූලව පියවර ගැනීමට විගණිත දිනය වූ 2016 පෙබරවාරි 18 දින දක්වා කටයුතු කර නොතිබුණි.

2.3.7 බස් නැවතුම්පොළ කඩ කාමර බදු දීම

------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කලවාන නගරය තුල තිබූ පැරණි බස් නැවතුම්පල හා පොදු වෙළඳ සංකීර්ණය 2014 ඔක්තෝබර් මස වනවිට කඩා ඉවත් කරන ලද නමුත් විගණිත දිනය වූ 2016 පෙබරවාරි 17 දින වනවිටත් රු. 771,662 ක් යොදවා මෙම ව්‍යාපෘතියේ කටයුතු කිසිවක් අරඹා නොතිබූ අතර මුල්ගල තැබීමේ උත්සවය සඳහා ඉදිකරන ලද රු. 115,400 ක් වටිනා සිහිවටන පුවරුවද ගලවා දමා තිබුණි.

(ආ) මෙම ව්‍යාපෘතිය යටතේ ඉවත් කරන ලද පැරණි බස් නැවතුම්පල වෙළඳ සංකීර්ණයේ කඩකාමර වෙනුවටට පැරණි වෙළඳපලහිමියන්ට තාවකාලිකව තම වෙළඳාම් කිරීම සඳහා එක් කඩ කාමරයකින් රු 500 බැගින් මාසික බදු දීමට තීරණය කර තිබූ නමුත්, සභාවේ කිසිදු පරීක්ෂාවකින් හෝ අනුමැතියකින් තොරව එකී කඩකාමර බදු කරුවන් විසින් ස්ථිර ගොඩනැගිලි ලෙසට බ්ලොක් ගල් හා සිමෙන්ති යොදා ඉදිකර තිබුණි. මේ අනුව විශාල ආර්ථික වටිනාකමක් සහිත නගර මධ්‍යයේ පවතින මෙකී වෙළඳසැල් මඟින් සභාවට විශාල ආදායමක් ලබා ගැනීමට තිබූ අවස්ථාව මඟහැරී ගොස් තිබූ බවද, සභාව සතු දේපල අවභාවිතාවට ඉඩ සැලසී තිබූ බව ද විගණනයේදී නිරීක්ෂණය විය.

03. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

ණයහිමි ලේඛණය අනුව ණයහිමියන්ට මුදල් නොගෙවීම හෝ ලේඛණ නඩත්තු නොවීම මත පසුගිය වර්ෂයන්ට අදාලව රු. 1,004,238 ක ශේෂයක් නිරීක්ෂණය වූ අතර, ණය පියවීමට හෝ ලේඛණ නිවැරදි කර ගැනීමට විගණිත දිනය වනවිටත් කටයුතු කර නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 පෙබරවාරි 24 දින කාර්මික නිලධාරී සහ විගණන නිලධාරීන් විසින් සිදු කරන ලද භෞතික පරීක්ෂාවට අනුව ප්‍රාදේශීය සභාවේ පොතුපිටිය උප කාර්යාලය , පුස්තකාලය හා ආයුර්වේද සායනය පවත්වාගෙන යන ගොඩනැගිල්ලේ පිටුපස කොටසෙහි වහලය සම්පූර්ණයෙන්ම කඩා වැටීම හා වහලය දිරාපත්වීම නිසා වර්ෂා ජලය ඇතුලට ගලා ඒම වැනි කරුණු හේතුවෙන් ගොඩනැගිල්ල සම්පූර්ණයෙන්ම ජරාජීර්ණ වී තිබුණි. මේ අනුව ඖෂධ ගබඩාව හා පුස්තකාලයෙහි උපකරණ හා පොත් වල ආරක්ෂාකාරීභාවයට දැඩි බලපෑමක් ඇති වී තිබුණි.

3.3 ආර්ථික නොවූ ගනුදෙනු

---------------------------

2015 වර්ෂයේ රු. 1,009,210 ක් වටිනාකමැති විදුලි පහන් උපකරණ මිලදී ගෙන තිබූ නමුත් වීථි පහන් අවශ්‍යතාවයන් හඳුනා නොගෙන මිලදී ගෙන ඇති එකී වීථි පහන් හා උපකරණ තොගය වර්ෂයකට වැඩි කාලයක් ගතවී ඇතත් 2016 පෙබරවාරි 17 දින භෞතික පරීක්ෂණ අවස්ථාව වනවිටත් නිෂ්කාර්යව ගබඩාව තුල ගොඩගසා තිබුණි.

3.4 නිශ්කාර්ය වත්කම්

---------------------

විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති අංක පීඊ/01/01 දරණ චක්‍රලේඛය ප්‍රකාරව ග්‍රාමීය ප්‍රදේශයන්හි “ඒ” ශ්‍රේණියේ මාර්ග වල ව්‍යාපාරික ප්‍රදේශ තුල හැම විදුලි කණුවකටම වොට් 110 අධිපීඩන සෝඩියම් වේපර් ලාම්පු පමණක් යෙදිය හැකි වුවත්, ඒ පිළිබඳ නොසලකා සහ ආයතනයේ අවශ්‍යතාවය හඳුනා නොගෙන රු. 195,000 ක් වටිනාකමැති වොට් 400 සෝඩියම් බල්බ් 100 ක් හා රු. 295,000 ක් වටිනාකමැති වොට් 250 සෝඩියම් චෝක් මිලදී ගෙන තිබුණි.

3.5 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

3.5.1 පරණ සිංහරාජ පාර (II අදියර) කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම

---------------------------------------------------------------------------

කර්මාන්තය සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවෙකු සමඟ රු.199,282 ක මුදලකට 2015 මාර්තු 23 දින ගිවිසුම් ගතවී තිබුණි. ඒ අනුව අඟල් 4 ඝණකමට කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කල යුතු වුවත්, මාර්ගයේ යොදා ඇති කොන්ක්‍රීට් තට්ටුවේ ඝනකම අඟල් 2½ ක් පමණ වූ අවස්ථාද නිරීක්ෂණය විය. ඒ අනුව ප්‍රමිත ඝනකමට බෙහෙවින් අඩුවෙන් මෙම කොන්ක්‍රීට් යෙදීම සිදු කර ඇති බවත්, ඒ අනුව ඉතා ඉක්මනින් කොන්ක්‍රීට් තට්ටුව කැඩී සංවර්ධනය කරන ලද මාර්ගය අබලන් තත්ත්වයකට පත්වීමේ අවදානමක් පවතින බව 2016 පෙබරවාරි 24 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

3.5.2 වෙළඳ සංකීර්ණ සහිත බස් නැවතුම්පොළ ඉදි කිරීම

-----------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කලවාන වෙළඳ සංකීර්ණය සහිත බස් නැවතුම්පල ඉදිකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රාදේශීය සභාව සහ දේශීය ණය හා සංවර්ධන අරමුදල මඟින් දැරීමේ පදනම මත 2009 මැයි 27 දින පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකු සමඟ රු. 8,867,228 ක වටිනා මාස 09 ක ගිවිසුම් කාලයකට ගිවිසුමකට එළඹ අත්තිවාරම ඉදිකිරීම වෙනුවෙන් එම කොන්ත්‍රාත්කරුට රු. 2,625,942 ක මුදලක් ගෙවා තිබුණි. පසුව කොන්ත්‍රාත්තුවේ වැඩ අතරමඟ නවතා දමා තිබූ අතර, එහිදී කොන්ත්‍රාත්කරුට එරෙහිව අවශ්‍ය නීතී ක්‍රියාමාර්ග හෝ ගෙන නොතිබුණි.

(ආ) ඉහත ඉදිකිරීම් කටයුතු අත්හල වැඩබිමේ ජලය පිරී පැවති අත්තිවාරම් වල වැසීම සඳහා රු. 1,700,000 ක ඇස්තමේන්තුවක් මත රු. 1,641,338 ක ගිවිසුමකට එළඹ අනතුරුව එම කොන්ත්‍රාත්කරුට රු. 44,624 ක ගෙවීමක් කර තිබුණි. මෙම කොන්ත්‍රාත්තුවට අදාල වැඩ අතරමඟ නතරවීම හේතුවෙන් ඉහත මුදල යටතේ නැවත මෙම වල ගොඩකිරීම සඳහා වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ගිවිසුම්ගත වී ඒ සඳහා රු. 667,293 ක මුදලක් ගෙවා තිබූ නමුත් අදාල වැඩබිමේ ගිවිසුමට අදාල වැඩ කටයුතු නිම කිරීමට අපොහොසත්වී වී තිබුණි. අනතුරුව නැවත අත්තිවාරම් වල පිරවීම සඳහා රු. 1,536,000 ක ඇස්තමේන්තු මුදලක් මත රු. 1,491,247 ක මුදලකට පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ගිවිසුම්ගතවී වැඩ නිම කර රු. 1,491,247 ක මුදලක් ගෙවාතිබුණි.ඒ අනුව අත්තිවාරම් වල වැසීම සඳහා පළමු හා දෙවන ගිවිසුම ඉක්මවමින් රු. 2,203,164 ක් ගෙවා තිබුණි.

(ඇ) නැවත පළමු අත්තිවාරමේ හා ඉතිරි වැඩ නිම කිරීම සඳහා රු. 73,502,000 ක ඇස්තමේන්තුවක් මත රු. 47,440,444 ක ගිවිසුමකට බැඳී එම ඉදිකිරීම් කටයුතු සඳහා රු. 5,581,140 ක මුදලක් ගෙවා තිබූ නමුත් අත්තිවාරමේ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීමට අපොහොසත්ව අදාල ඉදිකිරීම් කටයුතු අතරමඟ අතහැර දමා තිබුණි.

(ඇ) එහිදීද ගිවිසුම් කඩකිරීම සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම ප්‍රාදේශීය සභාව විසින් මගහැර තිබුණි. ඒ අනුව මෙම අවස්ථාව වනවිට සම්පූර්ණ ව්‍යාපෘතිය සඳහා එකතුව රු. 10,410,245 ක් වූ වියදමක් දරා තිබුණි.

(ඉ) තවද, ඉහත ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් බාහිර වගකීම වශයෙන් රු. 4,698,593 ක් අවිනිශ්චිත වගකීමක් සහ දේශීය ණය හා සංවර්ධන අරමුදල සඳහා රු. 6,173,000 ක වගකීමක්ද සභාවට දැරීමට සිදුව තිබුණි. මේ සම්බන්ධයෙන් විගණනය විසින් 2011 සහ 2012වර්ෂ වලදී පෙන්වා දී තිබූ නමුත් ඒ සඳහා නිසි ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් රජයේ මුදලින් ඉහත ව්‍යාපෘතිය සඳහා මේ දක්වා දරණ ලද වියදම වූ රු. 10,410,245 ක් සහ වගකීම් වශයෙන්වූ රු. 6,173,000 ක් නිශ්කාර්යය බවට පත්ව තිබුණි.

(ඊ) බිම්මහලේ කඩකාමර 18 ක් හා පළමු මහලේ කඩකාමර 31 ක් ඉදිකිරීමට යෝජිත මෙම ව්‍යාපෘති වර්තමානය වනවිට සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට පවරා ගැනීමට යෝජිත වන අතර, නාගරික සංවර්ධන අධිකාරිය මඟින් කලවාන වාණිජ උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය II අදියර යටතේ නව වෙළඳ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහාද යෝජනා වී තිබුණි.

3.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ස්ථිර කසල ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය මඟින් 2009 ඔක්තෝබර් 30 දින රු. 903,181 ක ආරම්භක මූල්‍ය ප්‍රතිපාදන ලබා දී තිබුණි. මෙකී ව්‍යාපෘතිය සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට (LRC) අයත් ඉඩමකින් අක්කර 09 ක ඉඩමක් ලබා ගැනීම සඳහා භූමිය වට මැනීම සඳහා රු. 70,000 ක මුදලක් ද වැය කර ඇති නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් මෙම ව්‍යාපෘතියේ ප්‍රගතියක් නිරීක්ෂණය නොවුණි. ප්‍රාදේශීය සභාව වෙත දෛනිකව එකතුවන කුණු හා ආදාහනාගාරයෙන් ඉවත් කරන ලද අපද්‍රව්‍ය සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේදයකින් තොරව කුකුලේගඟ කොට්ටණුහේන ඉඩමේ වල දැමීම පමණක් සිදු කරන බවත් නිරීක්ෂණය විය. මේ අනුව මෙකී ව්‍යාපෘතියේ පවතින අසාමාන්‍ය ප්‍රමාදය හේතුවෙන් එම ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා වන ගිවිසුම අවසන් කර ඇති බවත්, ප්‍රතිපාදිත මුදල නැවත ලබාදෙන ලෙස මධ්‍යම පරිසර අධිකාරිය විසින් දැනුම දී තිබියදී එකී මුදල් දිගින් දිගටම රඳවා ගැනීම මත ප්‍රාදේශීය සභාවට එරෙහිව නෛතිකව කටයුතු කිරීමේ අවදානමක් ද පැනනැඟී තිබුණි.

(ආ) කසල වෙන්කර එකතු කිරීම ප්‍රජාව අතර ප්‍රචලිත කිරීමේ අරමුණින් තෝරාගත් නිවාස සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් පරිදි බෙදාදීමට ලබා දී තිබූ කසල බඳුන් 134 ක් අතුරින් කසල බඳුන් 66 ක් සමෘද්ධිලාභීන්/ වැන්දඹු/කාන්තා/ආබාධිත මූලික කරගත් නිවාස සඳහා නොමිලේ ලබාදිය යුතු වුවත්, කසල බඳුන් 23 ක් එකී උපදෙස් වලට පටහැනිව බෙදා දී තිබුණි.ඉහල ආදායම් ලබන පවුල් සඳහා බඳුන් 34 ක් ලබාදිය යුතු වුවත්, කසල බඳුන් 24 ක් පමණක් විකුණා ඇති බවත් වර්තමානය වනවිට උපදෙස් පරිදි අදාල ප්‍රතිලාභීන්ට බෙදාදීමට කටයුතු නොකර කසල බඳුන් 74 ක් ආදාහනාගාර පරිශ්‍රයේ ගබඩා කර තිබූ බවත් තොග ලේඛණය අනුව කසල බඳුන් 13 ක ඌණතාවයක් තිබූ බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) කලවාන නගරයේ කසල බැහැර කිරීම වෙනුවෙන් ටෙන්ඩර් ලබාදීම සම්බන්ධයෙන් බඳුගත් බඳුකරු තෝරාගත් ආකාරය පිළිබඳව හෝ එකී කාර්යය සඳහා මාසිකව රු. 105,500 ක් ගෙවිය යුතු බවට තීරණය කරන ලද සභා තීරණය හෝ එකී ගාස්තුව තීරණය කරන ලද ආකාරය පිළිබඳව විගණනයේදී කරුණු අනාවරණය නොවූ අතර, මෙකී කරුණ සම්බන්ධයෙන් සභාව නියමිත පරිදි අවධානයක් හා ප්‍රමාණවත් අධීක්ෂණයකින් යුතුව කටයුතු කල යුතු වුවත්, එසේ ප්‍රමාණවත් දෛනික අධීක්ෂණයක් ඒ සම්බන්ධව සිදුකල බවට කිසිඳු තහවුරුවක් විගණනය වෙත ඉදිරිපත් නොවුණි.

04. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය.
------------------------------------------

4.1 අයවැය පාලනය.
-------------------

වැය විෂයයන් 22 කට අදාලව රු. 28,138,225 ක රු. 5,000 ට වැඩි මුළු ප්‍රතිපාදන කිසිඳු කාර්යයක යොදාගෙන නොතිබුණි.

4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම
--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර ඒ අනුව කටයුතු කර නොතිබුණි.

4.3 අභ්‍යන්තර විගණනය
------------------------

අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා ඒ සඳහා අවශ්‍ය පහසුකම් සපයා ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

4.4 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම
---------------------------------------------------------

විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

05. පද්ධති හා පාලනය
-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමණාකරණය
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඉ) සන අපද්‍රව්‍ය කළමනාකරණය